සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# 25 - ඉතිහාසය

# ශ්‍රී ලංකාවේ ඉතිහාසය

## පැරණි නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය

Department of Examinations



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

## 25 - ශ්‍රී ලංකාවේ ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

I පත්‍රය 01 x 40 = 40

II පත්‍රය

අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු = 18

සෙසු ප්‍රශ්න 3කට 14 බැගින් = 42

II පත්‍රය අවසාන ලකුණු = 60

අවසාන ලකුණු = 40 + 60 = 100

Department of Examinations

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ............................................................ √ △ $\frac{4}{5}$
............................................................
............................................................

(ii) ............................................................ √ △ $\frac{3}{5}$
............................................................
............................................................

(iii) ............................................................ √ △ $\frac{3}{5}$
............................................................
............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

Department of Examinations

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

Department of Examinations

***

**AL/2020/25/S-I(OLD)**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ඉතිහාසය I (I කොටස)
வரலாறு I (பகுதி I)
History I (Part I)

25 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

විභාග අංකය: ....................................

**උපදෙස්:**

- ※ මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු** කරන්න.
- ※ **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- ※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් ද'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) බෝධිවංශ (2) දළදාවංශ (3) දීපවංශ (4) ථූපවංශ (5) ධාතුවංශ 3 (.........)

2. (1) කොරතොට (2) ගෝකණ්ණ (3) මහාතිත්ථ (4) ඌරාතොට (5) ජම්බුකෝල පට්ටන 1 (.........)

3. (1) මෙගස්තිනිස් (2) චෙංහෝ (3) කොස්මස් (4) ප්ලිනි (5) ඔනෙසික්‍රිටස් 2 (.........)

4. (1) හැටදාගේ (2) රංගිරි දඹුල්ල (3) රන්කොත් වෙහෙර (4) දීඝවාපි (5) නිශ්ශංක ලතා මණ්ඩපය 4 (.........)

5. (1) විජයබා පිරිවෙන (2) පද්මාවතී පිරිවෙන (3) මයුරපාද පිරිවෙන (4) ආලාහන පිරිවෙන (5) සුනේත්‍රාදේවී පිරිවෙන 4 (.........)

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

6. (1) හෝපිටිගමු සෙල්ලිපිය - වෙළෙඳ නගරයක පරිපාලනය පිළිබඳව
   (2) වේලයික්කාර සෙල්ලිපිය - දළදා වහන්සේගේ ආරක්ෂාව පිළිබඳව
   (3) අඹගමුව සෙල්ලිපිය - අධිකරණ පරිපාලනය පිළිබඳව
   (4) දෙවනගල සෙල්ලිපිය - ඉඩම් ප්‍රදානයක් පිළිබඳව
   (5) තෝනිගල සෙල්ලිපිය - ධාන්‍ය තැන්පතු ක්‍රමය පිළිබඳව 3 (.........)

[දෙවැනි පිටුව බලන්න.



Department of Examinations

7. (1) විජය - තම්බපණ්ණි
(2) පණ්ඩුවාසදේව - කල්‍යාණි
(3) භද්දකච්චානා - ගෝකණ්ණ
(4) සංඝමිත්තා තෙරණිය - ජම්බුකෝළ පට්ටන
(5) හේමමාලා සහ දන්ත - ලංකා පට්ටන
2
(.........)

8. (1) පූජාවලිය - දළදා වහන්සේට පුදපූජා පැවැත්වීම පිළිබඳ ග්‍රන්ථයකි.
(2) සමන්තපාසාදිකා - විනය පිටකයට ලියන ලද අටුවා ග්‍රන්ථයකි.
(3) උත්තර විහාරට්ඨ කථා - අභයගිරි විහාර භික්ෂූන් විසින් ලියන ලද කෘතියකි.
(4) සද්ධර්මරත්නාවලිය - දඹදෙණි යුගයේ දී රචිත ගද්‍ය ග්‍රන්ථයකි.
(5) යාල්පාන වෛපවමාලෛයි - යාපන ප්‍රදේශයේ ඉතිහාසය ඇතුළත් ග්‍රන්ථයකි.
1
(.........)

9. (1) විලියම් ග්‍රෙගරි - ජාතික කෞතුකාගාරය පිහිටුවීම
(2) තෝමස් මෙට්ලන්ඩ් - ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවීම
(3) එඩ්වර්ඩ් බාන්ස් - ගන්නොරුවේ කෝපිවත්තක් ආරම්භ කිරීම
(4) ටොරිංටන් - මාර්ග බද්ද පැනවීම
(5) හර්කියුලීස් රොබින්සන් - ගම්සභා ක්‍රමය යළි ස්ථාපිත කිරීම
2
(.........)

10. (1) ඒ.ඊ. ගුණසිංහ - කම්කරු පක්ෂය
(2) ඇන්.ඇම්. පෙරේරා - ලංකා සම සමාජ පක්ෂය
(3) පොන්නම්බලම් අරුණාචලම් - ලංකා ජාතික සංගමය
(4) ජී.ජී. පොන්නම්බලම් - සමස්ත ලංකා දෙමළ සංගමය
(5) සිරිමා බණ්ඩාරනායක - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
5
(.........)

● අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරුය, **X** තීරුය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන** තුළ ලියන්න.

11.

| X | Y |
|---|---|
| (i) ගෝණ නදී | A මල්වතු ඔය |
| (ii) කදම්බ නදී | B මහවැලි ගඟ |
| (iii) ජජ්ජර නදී | C කලා ඔය |
| (iv) කප්පකන්දර නදී | D මැණික් ගඟ |
| (v) මහාවාලුකා නදී | E ඇඳුරු ඔය |

(1) AEDBC (2) BACED (3) CAEDB (4) DBCAE (5) EDBCA
3
(.........)

12.

| X | Y |
|---|---|
| (i) කෝකිල සංදේශය | A අලගියවන්න මුකවෙටි |
| (ii) ගුත්තිල කාව්‍යය | B ඉරුගල්කුලතිලක හිමි |
| (iii) සුභාෂිතය | C වෑත්තෑවේ හිමි |
| (iv) ලෝවැඩ සඟරාව | D තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| (v) සැළලිහිණි සංදේශය | E විදාගම මෛත්‍රී හිමි |

(1) AEDBC (2) BCAED (3) CAEDB (4) DEBCA (5) EDBCA
2
(.........)

13.

| X | Y |
|---|---|
| (i) පළමුවෙනි පරාක්‍රමබාහු රජතුමා | A කෝට්ටෙ |
| (ii) දෙවෙනි පරාක්‍රමබාහු රජතුමා | B ගම්පොළ |
| (iii) හතරවෙනි පරාක්‍රමබාහු රජතුමා | C කුරුණෑගල |
| (iv) පස්වෙනි පරාක්‍රමබාහු රජතුමා | D දඹදෙණිය |
| (v) හයවෙනි පරාක්‍රමබාහු රජතුමා | E පොළොන්නරුව |

(1) ABECD (2) BCDAE (3) CABED (4) CDABE (5) EDCBA
5
(.........)

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations

14. X

(i) සපුමල් කුමාරයා
(ii) ටිකිරි බණ්ඩාර
(iii) කොනප්පු බණ්ඩාර
(iv) මහා අස්ථාන
(v) කන්නසාමි

Y

A ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
B දෙවන රාජසිංහ රජතුමා
C හයවන බුවනෙකබාහු රජතුමා
D පළමුවන විමලධර්මසූරිය රජතුමා
E පළමුවන රාජසිංහ රජතුමා

(1) ABDCE (2) CADBE (3) CBADE (4) CEDBA (5) ECDBA (4)

15. X

(i) කින්නර බද්ද
(ii) කුරුවේ බද්ද
(iii) මඩිගේ බද්ද
(iv) බඩහැල බද්ද
(v) කොට්ටල් බද්ද

Y

A අලිඇතුන් පිළිබඳ කාර්යාංශය
B ප්‍රවාහන කාර්යාංශය
C ශිල්පීන් පිළිබඳ කාර්යාංශය
D විවීමේ කාර්යාංශය
E කුඹල් කාර්යාංශය

(1) ABDCE (2) BCDAE (3) DABEC (4) DBACE (5) EABDC (3)

- අංක **16** සිට **20** තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැළපෙන පිළිතුර තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

16. අනුරාධපුර යුගයෙහිදී ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දියානු ආක්‍රමණවල නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන්නේ පහත සඳහන් කවර වරණයේ ද?

(1) එළාර, සේන-ගුත්තික, සත්ද්‍රවිඩ, ෂඩ්ද්‍රවිඩ, පළමුවැනි රාජරාජ
(2) එළාර, සත්ද්‍රවිඩ, සේන-ගුත්තික, ෂඩ්ද්‍රවිඩ, පළමුවැනි රාජරාජ
(3) සේන-ගුත්තික, ෂඩ්ද්‍රවිඩ, එළාර, සත්ද්‍රවිඩ, පළමුවැනි රාජරාජ
(4) එළාර, ෂඩ්ද්‍රවිඩ, සේන-ගුත්තික, පළමුවැනි රාජරාජ, සත්ද්‍රවිඩ
(5) සේන-ගුත්තික, එළාර, සත්ද්‍රවිඩ, ෂඩ්ද්‍රවිඩ, පළමුවැනි රාජරාජ (5)

17. ශ්‍රී ලංකාවේ අගනගර විතැන්වීමේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේ ද?

(1) පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පළ
(2) පොළොන්නරුව, යාපහුව, දඹදෙණිය, කුරුණෑගල, ගම්පළ
(3) යාපහුව, පොළොන්නරුව, දඹදෙණිය, ගම්පළ, කුරුණෑගල
(4) පොළොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල, ගම්පළ, යාපහුව
(5) යාපහුව, පොළොන්නරුව, කුරුණෑගල, ගම්පළ, දඹදෙණිය (1)

18. ශ්‍රී ලංකාව පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේ ද?

(1) එඩ්වර්ඩ් බාන්ස්, රොබට් බ්‍රවුන්රිග්, ටොරිංටන්, විල්මට් හෝර්ටන්, හෙන්රි වෝඩ්
(2) රොබට් බ්‍රවුන්රිග්, එඩ්වර්ඩ් බාන්ස්, විල්මට් හෝර්ටන්, ටොරිංටන්, හෙන්රි වෝඩ්
(3) එඩ්වර්ඩ් බාන්ස්, හෙන්රි වෝඩ්, රොබට් බ්‍රවුන්රිග්, විල්මට් හෝර්ටන්, ටොරිංටන්
(4) හෙන්රි වෝඩ්, රොබට් බ්‍රවුන්රිග්, එඩ්වර්ඩ් බාන්ස්, විල්මට් හෝර්ටන්, ටොරිංටන්
(5) රොබට් බ්‍රවුන්රිග්, විල්මට් හෝර්ටන්, එඩ්වර්ඩ් බාන්ස්, හෙන්රි වෝඩ්, ටොරිංටන් (2)

19. බ්‍රිතාන්‍ය පාලන සමයෙහිදී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයන්හි නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?

(1) කෝල්බෲක්, මැනිං, කෲ-මැකලම්, සෝල්බරි, ඩොනමෝර්
(2) කෲ-මැකලම්, කෝල්බෲක්, මැනිං, සෝල්බරි, ඩොනමෝර්
(3) කෝල්බෲක්, ඩොනමෝර්, කෲ-මැකලම්, මැනිං, සෝල්බරි
(4) කෝල්බෲක්, කෲ-මැකලම්, මැනිං, ඩොනමෝර්, සෝල්බරි
(5) කෲ-මැකලම්, කෝල්බෲක්, සෝල්බරි, මැනිං, ඩොනමෝර් (4)

හතරවැනි පිටුව බලන්න.

Department of Examinations

Department of Examinations

**20.** නිදහස් ශ්‍රී ලංකාවේ අගමැතිවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?

(1) ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ඩබ්ලිව්. දහනායක, ජෝන් කොතලාවල
(2) ඩඩ්ලි සේනානායක, ඩී.එස්. සේනානායක, ජෝන් කොතලාවල, ඩබ්ලිව්. දහනායක, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක
(3) ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ඩබ්ලිව්. දහනායක
(4) ඩී.එස්. සේනානායක, ජෝන් කොතලාවල, ඩඩ්ලි සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ඩබ්ලිව්. දහනායක
(5) ඩඩ්ලි සේනානායක, ඩී.එස්. සේනානායක, ඩබ්ලිව්. දහනායක, ජෝන් කොතලාවල, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක 3 (.........)

● අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**21.** **වට්ට ගාමණී අභය රජු මුහුණ දුන් අභියෝග**

(1) සත් ද්‍රවිඩ ආක්‍රමණය
(2) තිය බ්‍රාහ්මණයාගේ කැරැල්ල
(3) බැමිණිතියා සාය
(4) පාණ්ඩ්‍ය ආක්‍රමණය 4
(5) කපිසීසගේ මරණින් පසුව සෙන්පතියන් වට්ටගාමණී අභය හැරයාම (.........)

**22.** **අනුරාධපුර යුගයේ රාජ්‍ය ආදායම**

(1) ඉඩම් බද්ද ප්‍රධාන ආදායම් මාර්ගය විය.
(2) මජිබෙකපති, මත්ස්‍ය භාගයෙන් අයකළ බද්ද ලෙස සැලකේ.
(3) වරාය බදු අයකළ බව ගොඩවාය සෙල්ලිපියේ සඳහන් වේ.
(4) රජු භූමියෙහි අධිපතියා ලෙසට සැලකූ බැවින් ඔහුට ඉඩම් බද්ද අයකළ හැකි විය. 5
(5) මරාල බද්ද අනුරාධපුර යුගයෙහි සිටි පාලකයින්ගේ ආදායම් මාර්ගයක් විය. (.........)

**23.** **ගම්පොළ රාජධානි සමය**

(1) තුන්වැනි විජයබාහු රජු ගම්පොළ පළමුවැනි පාලකයා විය.
(2) ගම්පොළ සමයේ දී නිශ්ශංක අලගක්කෝනාර කෝට්ටේ බලකොටුව ඉදිකර විය.
(3) සේනාලංකාධිකාර ගම්පොළ සමයෙහි සිටි බලවත් ප්‍රභු පවුලකි.
(4) තිසර සංදේශය ගම්පොළ සමයෙහි දී රචනා කරන ලද කෘතියකි. 1
(5) ගඩලාදෙණි විහාරය ගම්පොළ සමයෙහි දී ඉදිකරන ලදී. (.........)

**24.** **බ්‍රිතාන්‍ය පාලන සමයේ වතු වගාව**

(1) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ වතු ආර්ථිකයට මග පෑදුවේ ය.
(2) 1880 වර්ෂය වන තෙක් කෝපි වැදගත්ම වාණිජ භෝගය විය.
(3) රබර් වගාව පිළිබඳ පළමුවෙනි අත්හදා බැලීම හෙනරත්ගොඩ දී සිදු කෙරිණ.
(4) රබර් වගාව අසාර්ථක වූ පසු සිංකෝනා වගාව මෙරට ජනප්‍රිය විය. 4
(5) වතු වගාව සඳහා අවශ්‍ය ශ්‍රමිකයන් දකුණු ඉන්දියාවෙන් ගෙන්වනු ලැබී ය. (.........)

**25.** **1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංග**

(1) විධායක ජනාධිපති ධුරය
(2) ජාතික රාජ්‍ය සභාව
(3) සමානුපාතික නියෝජනය
(4) ජනමත විචාරණය 2
(5) දෝෂාභියෝගය (.........)

[පස්වැනි පිටුව බලන්න.

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ......... **5** ද, **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. රෝහණ රාජ්‍යය පිළිබඳව පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) මහානාග මාගම සිට රෝහණ ප්‍රදේශය පාලනය කළේ ය.
(B) කාජරගාමයේ දශභාතිකයන් පරාජය කළ ගෝඨාභය රෝහණ රාජ්‍යය පුළුල් කළේ ය.
(C) සේරු, සෝම හා ලෝන ප්‍රදේශ ඈඳා ගැනීම හේතුකොට ගෙන රෝහණ රාජ්‍යය පරිහානියට පත්විය.
(D) දුටුගැමුණු රජුගේ පාලන සමයේදී කොත්මලේ රෝහණ රාජධානියෙහි පාලන මධ්‍යස්ථානය විය. (1..........)

**27. යාපන රාජධානියේ ඉතිහාසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) පට්ටිනප්පාලෙයි ග්‍රන්ථය යාපන රාජධානියේ ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධානතම මූලාශ්‍රයකි.
(B) පරරාජශේකරම් යාපන රාජධානියෙහි ප්‍රථම පාලකයා විය.
(C) යාපන රාජධානියෙහි පාලකයින් විසින් සීහාවක බැරැණ්ඩි කෝවිල ඉදිකරන ලදී.
(D) ඉබන් බතුතාගේ වාර්තාවට අනුව යාපන රාජධානියෙහි පාලකයා ශ්‍රී ලංකාවේ සුල්තාන්වරයා විය. (5..........)

**28. වැලිවිට සරණංකර හිමියන් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) දෙගල්දොරු විහාරයෙහි දී මහණ උපසම්පදාව ලැබීම
(B) සිල්වත් සමාගම පිහිටුවීම
(C) සියම් උපසම්පදාව රැගෙන ඒමට මූලිකවීම
(D) අස්ගිරි පාර්ශවයේ පළමුවෙනි මහනාහිමි තනතුරට පත්වීම (3..........)

**29. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
(B) සර්වජන ඡන්ද බලය පිරිනැමීම
(C) රාජ්‍ය සේවා කොමිසම පිහිටුවීම
(D) කැබිනට් ක්‍රමය හඳුන්වාදීම (5..........)

**30. 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ගම්පොළ වල්ලහගොඩ දේවාල පෙරහැර මීට ප්‍රධාන හේතුවක් විය.
(B) මෙම කෝලාහලය පාලනය කිරීම සඳහා ඇඳිරි නීතිය පනවනු ලැබී ය.
(C) රොබට් චාමර්ස් මෙකල බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා විය.
(D) මෙම කෝලාහලයේ ප්‍රතිඵලයක් වශයෙන් දහසකට වැඩි පිරිසක් මියගිය බව වාර්තා වේ. (2..........)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31. නිශ්ශංකමල්ල රජු ආක්‍රමණය කළ දකුණු ඉන්දියානු ප්‍රදේශය කුමක් ද?**

(1) මධුරාපුර (2) අතිවීරරාම පට්ටනම් (3) සෝමේශ්වරම්
(4) මහබලිපුරම් (5) රාමේශ්වරම් (5..........)

[ගෙවැනි පිටුව බලන්න.

Department of Examinations

32. යාපහුව රාජධානියේ පළමුවෙනි පාලකයා කවරෙක් ද?
(1) දෙවෙනි පරාක්‍රමබාහු (2) තුන්වෙනි විජයබාහු (3) තුන්වෙනි පරාක්‍රමබාහු
(4) පළමුවෙනි බුවනෙකබාහු (5) දෙවෙනි බුවනෙකබාහු
(4)

33. ගම්පොළ සමයේ දී ඉදිකළ ලංකාතිලක විහාරයේ ප්‍රධාන ගෘහනිර්මාණ ශිල්පියා කවරෙක් ද?
(1) ගණේශ්වරාචාර්ය (2) ස්ථපතිරායර (3) දෙවරගම්පළ සිල්වත්තැන
(4) දේවේන්ද්‍ර මූලාචාරින් (5) තිලගම පටබැන්දා
(2)

34. විද්‍යොදය පිරිවෙන පිහිටුවන ලද්දේ කවරෙකු විසින් ද?
(1) රත්මලානේ ධම්මාලෝක හිමි (2) වලානේ සිද්ධාර්ථ හිමි
(3) හික්කඩුවේ සුමංගල හිමි (4) රත්මලානේ ධර්මාරාම හිමි
(5) වැලිවිටියේ සෝරත හිමි
(3)

35. ලංකා විශ්වවිද්‍යාලයේ පළමුවෙනි උපකුලපතිවරයා කවරෙක් ද?
(1) අයිවර් ජෙනිංග්ස් (2) මාර්කස් ප්‍රනාන්දු (3) නිකලස් ආටිගල
(4) ජී.පී. මලලසේකර (5) ඊ.ඕ.ඊ. පෙරෙයිරා
(1)

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවෙනි ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | ලක්දිව පළමුවෙනි සංඝභේදය ඇති වූයේ මහසෙන් රාජ්‍ය සමයෙහි දී ය. | කුපික්කල තිස්ස හිමියනට මහසෙන් රජු ජේතවන විහාරය පූජා කළේ ය. | 3 (.........) |
| 37. | ගල්විහාර සෙල්ලිපිය පළමුවෙනි පරාක්‍රමබාහු රජු විසින් සිදු කළ සංඝ සාමග්‍රිය ගැන තොරතුරු වාර්තා කර තිබේ. | පළමුවෙනි පරාක්‍රමබාහු රජු සෙල්ලිපි වැඩිම සංඛ්‍යාවක් පිහිටුවා ඇති පාලකයා ලෙස සලකනු ලැබේ. | 1 (.........) |
| 38. | ජේසුයිට් නිකාය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද්දේ ඉංග්‍රීසින් විසිනි. | ලන්දේසිහු ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ඇළ මාර්ග පද්ධතියක් ඉදි කළහ. | 4 (.........) |
| 39. | මෙරට අධ්‍යාපන කටයුතු ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදුකළ යුතු බවට කෝල්බෲක්-කැමරන් කොමිසම විසින් යෝජනා කරන ලදී. | පරිපාලන කටයුතු සඳහා ස්වදේශිකයන් පුහුණු කිරීම පිණිස ඉංග්‍රීසි භාෂාව අධ්‍යාපන මාධ්‍යය විය යුතු බව කෝල්බෲක්-කැමරන් කොමිසමෙහි අදහස වූ බව පෙනේ. | 5 (.........) |
| 40. | ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබාගන්නා ලද්දේ 1955 වර්ෂයෙහි දී ය. | එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ ඝාතනයෙන් පසුව හිස්, වූ අගමැති තනතුරට සිරිමා බණ්ඩාරනායක මැතිණිය පත්කරන ලදී. | 1 (.........) |

* *

[ගත්වැනි පිටුව බලන්න.



Department of Examinations

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

## පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்

විෂයය අංකය / பாட இலக்கம் **25**

විෂයය / பாடம் **ශ්‍රී ලංකා ඉතිහාසය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 4 | 31. | 5 |
| 02. | 1 | 12. | 2 | 22. | 5 | 32. | 4 |
| 03. | 2 | 13. | 5 | 23. | 1 | 33. | 2 |
| 04. | 4 | 14. | 4 | 24. | 4 | 34. | 3 |
| 05. | 4 | 15. | 3 | 25. | 2 | 35. | 1 |
| 06. | 3 | 16. | 5 | 26. | 1 | 36. | 3 |
| 07. | 2 | 17. | 1 | 27. | 5 | 37. | 1 |
| 08. | 1 | 18. | 2 | 28. | 3 | 38. | 4 |
| 09. | 2 | 19. | 4 | 29. | 5 | 39. | 5 |
| 10. | 5 | 20. | 3 | 30. | 2 | 40. | 1 |

Department of Examinations

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு — 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் — 1 × 40 = 40

**AL/2020/25/S-I(OLD)**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**OLD**


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | | |
|---|---|---|---|
| ඉතිහාසය<br>வரலாறு<br>History | I<br>I<br>I | 25 | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ..................................




Department of Examinations

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020 - පැරණි නිර්දේශය

ඉතිහාසය I (II කොටස)

ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

උපදෙස්:
- පළමුවන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
  (පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) මැණික් ගඟ (ii) නාච්චදූව වැව (iii )පොළොන්නරුව

(vi) ගම්පොළ (v) දෙවිනුවර (vi) මීගමුව

(vii) කොට්ටියාරම (viii) සබරගමුව පළාත

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි.)*

2. "මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා භාවිත කළ හැකි ප්‍රධානතම මූලාශ්‍රය මහාවංසයයි."

(i) මහාවංසයේ කතුවරයා නම් කරන්න

දික්සඳ සෙනෙවි පිරිවෙන්පති මහානාම හිමි

*(ලකුණු 01යි)*

(ii) මහාවංසය ලිවීම සඳහා පදනම් කරගනු ලැබූ මූලාශ්‍රය දෙකක් නම් කරන්න.

දීපවංසය, උත්තරවිහාරට්ඨකථාව, සීහළට්ඨකතා විනයට්ඨකථාව, පුඤ්ඤපොත්ථක, දීපවංසට්ඨකථාව, චේතියවංසට්ඨකථාව, මහාබෝධිවංසට්ඨකථාව, සහස්සවත්ථු අට්ඨකථාව, සහස්ස වත්ථුප්ප්‍රකරණය, මහාචේතියවංසට්ඨකථාව, සීමාකථා, හෙළටුවා.

*(ලකුණු 02යි)*

(iii) දේවානම්පියතිස්ස රජතුමා හා අශෝක අධිරාජයා අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා මහාවංසයේ සඳහන් වන ආකාරය සැකෙවින් දක්වන්න.

➢ දේවානම්පියතිස්ස රජතුමා හා අශෝක අධිරාජයා බොහෝකල් අදෘෂ්ට මිත්‍රයෝය.

Department of Examinations

- පළමු අභිෂේක දිනයේදී ස්වභාවිකව පහළ වී යයි කියනු ලබන මුතු, මැණික් ආදී වටිනා වස්තූන් මාහැඟි පඬුරු ලෙස අරිට්ඨ කුමරු ප්‍රධාන කොටගත් පිරිස අත, අශෝක අධිරාජයා වෙත යැවීම.
- දේවානම්පියතිස්ස රජු නැවත අභිෂේක ගැන්වීම සඳහා අවශ්‍ය රාජ කකුධ භාණ්ඩ ඇතුළු අභිෂේකය සඳහා අවශ්‍ය දෑ අශෝක අධිරාජයා විසින් එවීම (රාජ කකුධ භාණ්ඩ - වල්විදුනාය, නලල්පටය, මඟුල්කඩුව, සේසත, මිරිවැඩිසඟළ, ඉස්වෙළුම, කර්ණාභරණ, රන් දාමයක්, කෙණ්ඩියක්, දක්ෂිණාවෘත සංඛය, මාහැඟි අත්පිස්නා, අනෝතත්ත විලේ හා ගංගා නම් ගඟේ ජලය, මාහැඟි ඔසු, ක්ෂත්‍රිය කන්‍යාවක් ).
- මේ දෙදෙනා අතර මිත්‍රත්වය හේතුකොට ගෙන මෞර්ය අභිෂේක ක්‍රමය මෙරටට හඳුන්වාදීම සිදු වූ අතරම, තිස්ස රජුට 'දේවානම්පිය' යන උපාධිනාමය පිරිනැමීමද සිදුවිය.
- පාලකයන් දෙදෙනා අතර හටගත් සම්බන්ධතා හේතුකොටගෙන මෙරටට මෞර්ය රාජාණ්ඩු ක්‍රමයේ ආභාසය ලැබීම (සේනාපති, පුරෝහිත, දණ්ඩනායක, භාණ්ඩාගාරික ආදී නිලතල).
- මෙම රාජ්‍ය තාන්ත්‍රික සබඳතා අතරේම මෙරටට බුදුදහම හඳුන්වාදීමට කටයුතු කිරීම, ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් ප්‍රදානය හා සර්වඥ ධාතූන් ලබාදීමද සිදුවිය.

(මේ කාරණය අපේක්ෂකයන් වඩාත් අවධාරණය කොට ලියා තිබිය හැකියි.)

*(ලකුණු 02යි)*

Department of Examinations

**(iv) මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා ඇති ප්‍රධානතම මූලාශ්‍රය ලෙස මහාවංසය සැලකිය හැකි වන්නේ කෙසේදැයි පරීක්ෂා කරන්න.**

- විජය රජුගේ පටන් මහසෙන් රාජ්‍ය කාලය දක්වා ලාංකේය ඉතිහාසය හැදෑරීමට තිබෙන මූලාශ්‍රය අතුරින් මහාවංසය ප්‍රධාන වීම.
- එමගින් ක්‍රි. පූ. 6 වන සියවසේ සිට මහසෙන් රාජ්‍ය සමයේ අවසානය දක්වා අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනගාගත හැකිවීම.
- දේශපාලනය හා පරිපාලනය පිළිබඳ තොරතුරු වාර්තාවීම (රජවරු, රාජවංශ, රජවරුන්ගේ අනුපිළිවෙළ, ඥාති සබඳතා, පාලකයන්ගේ බල ව්‍යාප්තිය, උපාරජවරුන්, ප්‍රාදේශීය පාලකයන්, නිලධාරීන්, දකුණු ඉන්දියානු ආක්‍රමණ). මේවායේ විශ්වසනීයත්වය ශිලාලේඛන ඇතුළු පුරාවිද්‍යාත්මක සාධක, ඉන්දීය මූලාශ්‍ර හා විදේශ ලේඛක වාර්තා මඟින් තහවුරුවේ (බ්‍රාහ්මී ලිපි, කුසලාන්කන්ද, බෝවත්තේගල, වැලඑල්ලුගොඩ, කොට්ටදමුහෙළ, වෙස්සගිරිය, මහරත්මලේ, තිඹිරිවැව, කොරවක්ගල, සිතුල්පව්ව ආදී සෙල්ලිපි, වල්ලිපුරම් රන්පත).
- කෘෂි කර්මාන්තය, වෙළෙඳාම, වාරි කර්මාන්ත, වාරි තාක්ෂණය, කර්මාන්ත ආදී ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු වාර්තාවීම (තෝනිගල, නාගිරිකන්ද, ගොඩවාය, මීන්විල, පාලුමැකිච්චාව, මහකපුගොල්ලෑව, අලියාකඩ, බෝවත්තේගල, ලබුඇටබැඳිගල ආදී සෙල්ලිපි, පෙරිමියන්කුලම් පර්වත ලිපිය, කාසි හා විවිධ නටබුන් මගින් මෙම තොරතුරු තහවුරු වී ඇත.).

➢ සමාජ, ආගමික හා සංස්කෘතික ඉතිහාසය පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය වීම.

- බුදුරජාණන් වහන්සේගේ ලංකා ගමන්, දිවයිනේ බුදු සසුන පිහිටුවීම, බුද්ධාගමට රාජ්‍යානුග්‍රහය ලැබීම, භික්ෂු-භික්ෂුණී ශාසනය පිළිබඳ තතු, ආරාම පූජා, මහාවිහාරය හා ඊට අයත් ගොඩනැගිලි ඉදිකිරීම, ශ්‍රීමහා බෝධි රෝපණය, රුවන්වැලිසෑය ඉදිකිරීමේ පුවත, අභයගිරි විහාර පූජාව, ජේතවන විහාරය ඇතුළු වෙහෙර විහාරස්ථාන ඉදිකිරීම, අරියවංශ සූත්‍ර දේශනාව වැනි ආගමික උත්සව පිළිබඳවත්, අධ්‍යාපනය, පංචශීලය පදනම් කරගත් සමාජය ආදී විවිධ අංශ පිළිබඳවත් තොරතුරු වාර්තාවීම හා මිහින්තලේ, සිතුල්පව්ව්, තෝනිගල හා රජගල ආදී සෙල්ලිපි මගින් ඒවා තහවුරුව තිබීම.

*(ලකුණු 09යි)*

3. අනුරාධපුර හා පොළොන්නරු යුගවල ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ක්‍රමයේ අනුක්‍රමික වර්ධනය පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ විස්තර කරන්න.

**(i)** වැව් **(ii)** ඇළ මාර්ග **(iii)** වාරි තාක්ෂණය

**(i)** වැව්

➢ වැව් ඉදිකිරීමේ ක්‍රමික වර්ධනයක් දක්නට ලැබීම.

- ක්‍රි. පූ. හතරවන සියවසේදී පණ්ඩුකාභය රජු විසින් ජයවැව, අභයවැව, ගාමිණිවැව යන වැව් තුනක් ඉදිකළ බව මහාවංසයේ සඳහන්වීම.
- ක්‍රි. පූ. තුන්වන සියවසේදී දේවානම්පියතිස්ස රජු තිසාවැවත් පසුව නුවරවැවත් ඉදිකරවීම.
- ක්‍රි. ව. පළමුවන සියවසේදී වසභ රජු විසින් මහා පරිමාණ වැව් ඉදිකරවීම ආරම්භ කිරීම: ඒ අනුව වැව් එකොළහක් කරවීම (මහවිලච්චිය, මානන්කට්ටිය, නොච්චිපොතාන, හිරිවඩුන්න).
- ක්‍රි. ව. තුන්වන සියවසේදී මහසෙන් රජතුමා විසින් වැව් දහයක් කරවීම (ඒ අතුරින් මින්නේරි වැව වඩාත් වැදගත් ය. රජතුමා 'මින්නේරි දෙවියෝ' ලෙස සැලකීම. හුරුලුවැව, මහගල්කඩවල වැව, මාගල්ල වැව, හුළුගල්ල වැව, කවුඩුල්ල වැව, කනදරා වැව).
- පළමුවන උපතිස්ස රජු කුඩා ප්‍රමාණයේ වැව් හයක් ඉදිකරවීම. මේවා වර්තමානයේ හඳුනා ගැනීම දුෂ්කර ය.
- ධාතුසේන රජු කලා වැව ඇතුළු වැව් දහඅටක් කරවීම (මහාදත්තවාපි, පානන්කාමකුලම්, මාළිය වැව, යෝධ වැව).
- ක්‍රි. පූ. හයවන සියවසේදී දෙවැනි මුගලන් රජු වැව් තුනක් කරවීම (නාච්චදූව - පත්තපාසාණවාපි, පදවිය - ධනවාපි, ගරිතරවාපි - මෙතෙක් හඳුනාගෙන නොමැත).
- පළමුවන අග්බෝ රජු විසින් ඉදිකරන ලද වැව් දෙකක් වන්නේ කුරුඳු වැව (තන්නිමුරිප්පුකුළම) හා මාමඩුව වැව ය.

Department of Examinations

- දෙවන අග්බෝ රජු කන්තලේ හා ගිරිතලේ වැව් කරවූහ.
- අටවන, නවවන හා දහවන සියවස්වලදී විශාල ජලාශ ඉදිකළ බවක් නොපෙනේ. ප්‍රතිසංස්කරණ සිදු කර ඇත. (පස්වැනි අග්බෝ, දෙවන උදය, දෙවන මහින්ද, දෙවන සේන)
- පළමුවන විජයබාහු රජතුමා ඌව පළාතේ බුදුගුණ වැව කරවීය.
- පළමුවන පරාක්‍රමබාහු රජු ඉදිකරවන ලද වැව් අතුරින් පරාක්‍රම සමුද්‍රය ඉතා වැදගත්ය. මහාවංසයට අනුව රජු ප්‍රධාන වැව් 163 ක්, කුඩා වැව් 2376 ක් කරවා ඇත.
- දදුරු ඔයේ කොට්ට බද්ද, සූබර නිජ්ජර හා දෝරදත්තික යන ස්ථාන තුනෙහි ඉදිකරවන ලද ජල යෝජනා ක්‍රමය ඉතා වැදගත් වේ.
- අනුරාධපුර හා පොළොන්නරු යුගවලදී වළවේ, කිරිඳි හා මැණික් යන ගංගා මුල්කරගෙන රුහුණේද ජලාශ ඉදිකර ඇත.

**(ii)** ඇළ මාර්ග

- ක්‍රි. පූ. පළමුවන සියවසේදී කුටකණ්ණ තිස්ස රජතුමා කරවන ලද වන්නක ඇළ (මීන්විල සෙල්ලිපිය, මහාවංසය).
- වසභ රජු ඇළ මාර්ග දොළහක් සෑදූ අතර ඇළහැර යෝද ඇළ (ආළිසාර ඇළ) ඉන් ප්‍රධාන වේ. ඇළහැරදී අඹන්ගඟ හරස් කර බැඳ, ඇළ මාර්ගය ඔස්සේ සැතපුම් 30 ක් බටහිර දෙසට ජලය රැගෙන ගොස් ඇත.
- මහසෙන් රජු පබ්බතන්ත ඇළ කරවා මහවැලි ගඟේ ජලය නැගෙනහිරට ගෙනයාම හා අඹන් ගඟ හරස් කොට තලවතු ඇළ සාදවා එමගින් ජලය මින්නේරි ඇළට ගෙනයෑම.
- ධාතුසේන රජු සැතපුම් පනස් හතරක් දිග ජයගඟ කරවීම. මෙය කලාවැවෙන් ආරම්භ වී තිසාවැවෙන් අවසන් වේ.
- මල්වතු ඔයේ ජලය සැතපුම් 17 ක් දිග ඇළක් මගින් මන්නාරම් දිස්ත්‍රික්කයේ පිහිටි යෝදවැවට ගෙන යෑම.
- මහවැලි ගඟේ මණිමේඛලා සිට සැතපුම් 17 ක් දිග මිනිපේ ඇළ පළමුවන අග්බෝ රජු විසින් කරවීම.
- කළු ගඟේ හත්තොට අමුණෙන් පටන් ගන්නා සැතපුම් 28 ක් දිග ඇළ.
- අඹන්ගඟේ අංගමැඩිල්ල ස්ථානයේ සිට එන අංගමැඩිල්ල ඇළ හෙවත් ආකාශ ගංගාව.
- පළමුවන පරාක්‍රමබාහු රජු ඇළවේලි 165 ක්, ඇළ මාර්ග 3910 ක් කරවූ බව හා කැඩීබිඳී ගිය ඇළවේලි 1753 ක් ප්‍රතිසංස්කරණය කරවීම.

Department of Examinations

**(iii) වාරි තාක්ෂණය**

- තාක්ෂණය වඩාත් කැපීපෙනේනනේ කුඩා වැව්වලට වඩා විශාල වැව් ඉදිකිරීමේදීය. භූමිය මැණීම, සමකිරීම හා සමෝච්චකරණය සම්බන්ධයෙන් ඉහළ ඉංජිනේරු දැනුමක් පළකොට ඇත.
- දෙපස පිහිටි කඳුගැට ආධාරයෙන් වැව් බැම්ම සෑදීම සිදුකර ඇත. එහෙත් ආකට්ටිමුරුප්පු හා යෝදවැවේ තාක්ෂණය මීට වෙනස්ය. යෝදවැවේ බැම්ම සකස් කර ඇත්තේ කොන් දෙකක දිග වේලි දෙකක් බැඳීමෙනි. එහි බැම්ම චාපයක හැඩය ගෙන ඇත.
- වැව් ඉදිකිරීමේදී සුවිශේෂ තාක්ෂණික අංග කීපයක් දක්නට ලැබීම - වැව් බැම්ම, සොරොව්ව, බිසෝකොටුව, සලපනාව.
- වැව් එකිනෙකට සම්බන්ධ කිරීමට ඉදිකොට ඇති සංකීර්ණ ඇළ මාර්ග ජාලය (ඇළහැර ඇළ මින්නේරි වැව දක්වා සකස් කරන විට භූ ලක්ෂණ උපයෝගි කර ගැනීම, ජයගඟේ මුල් සැතපුම් දාහතේ ජලබෑස්ම සැතපුමකට අඟල් හයක් පමණක් වීම).
- ජයගඟ මෙරට ජල මාර්ග තාක්ෂණයේ ශ්‍රේෂ්ඨතම නිර්මාණය වේ. ජය ගඟින් තැනින් තැන විහිදී යන අතුරු ඇළවල් මඟින් කුඩා ගම් වැව් රැසකට ජලය සැපයේ.
- ගංගා හරස් කොට බැමි බැඳීමේ තාක්ෂණයට හොඳම උදාහරණය අංගමැඩිල්ල බැම්මයි (අඹන් ගඟේ පටු ස්ථානයක ගල්පරයක් මත විශාල ගල්කුට්ටි තැන්පත් කොට ඉදිකර ඇත).
- එකළ සූක්ෂම මිනුම් උපකරණ භාවිතා කර ඇත (පැරණි මාදුරු ඔය සොරොව්ව).

*(ලකුණු 14යි)*

4. පහත දැක්වෙන ක්ෂෙත්‍ර යටතේ පළමුවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය අගය කරන්න.

 **(i) දිවයින එක්සේසත් කිරීම** **(ii) දකුණු ඉන්දියානු ආක්‍රමණ**

**(i) දිවයින එක්සේසත් කිරීම**

- දක්ඛිණ දේශයේ පාලකයා බවට පත්වීම. පඬුවස්නුවර (පරාක්‍රමපුරය) පාලන මධ්‍යස්ථානය කරගැනීම.
- දේශසීමාවේ රැකවල් යෙදවීම හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට කටයුතු කිරීම.
- හමුදා සංවිධානය කිරීම.
- රජරට අල්ලා ගැනීම සඳහා ගජබාහු රජු සමග සටන් කිරීම.
- මහාමලය දේශය අල්ලා ගැනීම.
- පොළොන්නරුව අල්ලා ගැනීම.
- ගජබාහු සමග ගිවිසුමකට එළඹීම (සංගමුවිහාර ලිපිය).

Department of Examinations

- ගජබාහු මියගිය පසු ගිවිසුම උල්ලංඝනය වීම නිසා රෝහණයේ මානාභරණ හා සටන් කිරීම.
- මානාභරණ රෝහණයට පලායෑම හා පරාක්‍රමබාහු පොළොන්නරුවේ රජවීම.
- ක්‍රි. ව. 1153 දී පරාක්‍රමබාහු සිහසුනට පත්වීම.
- රුහුණේ කැරලි ඇතිවීම හා සුගලා රැජින පරාජයට පත් කිරීම.
- දළදා පාදා ධාතූන් වහන්සේ අත්පත් කර ගැනීම.
- මධ්‍යගත පරිපාලන සංවිධානයක් ගොඩනැගීම.

*(ලකුණු 08යි)*

**(ii) දකුණු ඉන්දියානු ආක්‍රමණ**

- මේ ආක්‍රමණය ගැන මහාවංසය, පල්ලවරායන්පෙට්ටෙ, තිරුවාලංගාඩු, ආර්පාක්කම් යන සෙල්ලිපිවල සඳහන් කර ඇත.
- මේ යටතේ මූලික වශයෙව් සිදුවූයේ පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණයකි.
- දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය දේශයේ සිංහාසනය සඳහා කුලශේඛර හා පරාක්‍රම පාණ්ඩ්‍ය යන පාණ්ඩ්‍ය කුමාරවරුන් දෙදෙනා අතර සටන් ඇති වීම. මේ අරගලයේදී පරාක්‍රම පාණ්ඩ්‍ය, පරාක්‍රමබාහු රජුගෙන් යුද්ධෝපකාර ඉල්ලා සිටි අතර කුලශේඛර චෝළයින්ගෙන් උදවු ලබා ගත්තේය.
- ලංකාපුර සෙනෙවි යටතේ පාණ්ඩ්‍ය දේශයට සේනාවක් යැවීමට සැලසුම් කළත් එම පිරිස දිවයිනෙන් පිටත්වීමට පෙර චෝළ ආධාර ඇතිව කුලශේඛර විසින් පරාක්‍රම පාණ්ඩ්‍ය මරා දමා මධුරාපුරය අල්ලා ගැණිනි.
- කෙසේවෙතත් ලංකාපුර සෙනෙවි සේනාවක් රැගෙන පාණ්ඩ්‍ය දේශයට ගොස් කුලශේඛර සමඟ සටන් කීපයක්ම කළේය.
- ලංකාපුර සෙනෙවි තලඩිල්ල වරායේ සිට රාමිස්සරය (රාමේශ්වරම) අල්ලා ගන්නා තෙක් සුළු සටන් කිහිපයක් කළ අතර ඉනික්බිතිව රාමිස්සරයේ සිට කුන්දුකාලයට ගොස් එහි පරාක්‍රමපුර නමින් බලකොටුවක් ඉදිකර කඳවුරු බැඳගත්තේය.
- එහි සිට ලංකා හමුදාව වෙනත් ගම් අත්පත් කර ගැනීම (එරුක්කට්ට, කොළුවර, මරුථුප) හා නියම්ගම් කොල්ලකෑම සිදු කළේය.
- වඩලියේ සටනින් පසු මෙම සේනාව පරාක්‍රමපුරට පසුබැසීම හා කුලශේඛර ප්‍රබල සේනාවක් රැගෙන විත් පරාක්‍රමපුර බලකොටුවට ගොඩින් හා මුහුදින් පහරදීම සිදුවිය.
- එහෙත් කුලශේඛර පරාජය කරමින් සිංහල සේනාව කුලශේඛර රජුගේ එරුක්කාවූර බලකොටුව ගිනිබත් කිරීම. ලංකාපුර සෙනෙවි එහි බලකොටුවක් ඉදිකර ගැනීම.
- ඉන්පසුව, එහි සිටිමින් වඩලිය, සිරිවලය ඇතුළු බලකොටු හතරක් අල්ලා ගැනීම, පාණ්ඩ්‍ය සේනාපතිවරුන් කීපදෙනෙක් පරාජය කිරීම, පාණ්ඩ්‍ය සේනාපතිවරුන් කීපදෙනෙක් සිංහල සේනාවට එකතුවීම, සටනකින් සිංහල සේනාව කංගකොණ්ඩානයට පසුබැසීම යන වැදගත් සිදුවීම් සිදුවිය.

Department of Examinations

- නොබෝ දිනකින් වාලක්කෝට්ටය හා නෙට්ටූරුව අල්ලා ගැනීම. නෙට්ටූරුවේදී ලංකාපුර සෙනෙවි උපක්‍රම යොදමින් ද්‍රවිඩ අධිපතීන් හා නිලධාරීන් කීදෙනෙකුට තෑගි භෝග හා තානාන්තර පිරිනමා පක්ෂපාතී කරවා ගැනීම.
- එයින් පසු සිංහල සේනාව අනිවලක්කොට්ටයේ කඳවුරු බැඳගෙන කුලශේඛර පරදවා මධුරාපුරය අල්ලා ගැනීම.
- ලංකාපුර සෙනෙවි මීලඟ සටන් නෙට්ටූරුව සිට ආරම්භ කිරීම. ඒ වනවිට කුලශේඛර රජු පාතපත බලකොටුවේ රැඳීසිටීම. සිංහල සේනාව දරුණු අන්දමින් සටන්කර පාතපත බලකොටුව ඇතුළු තවත් ප්‍රදේශ ද සෙම්පොන්මාරිය අල්ලා ගැනීම.
- කෙසේවෙතත්, කුලශේඛර රජුට නොසිතූ අයුරින් උදවු ලැබීම නිසා කුලශේඛර රජුගේ සේනාව බල සම්පන්න වීම
- දෙපිරිස අතර වූ මේ සටනේදී සිංහල සේනාව උතුරු දොරටුවෙන් (කේසධාතුකිත්ති හා ජගත්විජයගේ මෙහෙයවීමෙන්) හා දකුණු දොරටුවෙන් (ලංකාපුරදේව, ලංකාගිරිසෝර, ගෝකණ්ණ දණ්ඩනායක හා කේසධාතු ලෝකගේ මෙහෙයවීමෙන්) නික්ම කුලශේඛරගේ සේනාවට පහරදී දරුණු විනාශයක් කර ජය ගැනීම
- ඉන්පසු තවත් සටන් කිහිපයක් දෙපිරිස අතර සිදුවීම හා දරනු සටනක් රාජිනාපුරයේදී ඇතිවීම. කුලශේඛර රජු සිටි රාජිනාපුර බලකොටුව වටලා දණ්ඩනායක ගෝකණ්ණ, ලංකාපුරදේව හා කේසධාතු ලෝක දොරටු බිඳහෙළා පවුරු උඩින් පැන බලකොටුව විනාශ කිරීම. සිංහල සේනාව රාජිනාපුරය ජය ගැනීම
- ඉන්පසු මදුරාපුරයට ගොස් ලංකාපුර සෙනවි ප්‍රධාන සේනාව සිංහල රජුගේ උපදෙස් මත වීරපණ්ඩු අභිශේක කර සිහසුනේ පිහිටවූ නමුත් සටන එතනින් නතර නොවුනි.
- කුලශේඛර රජු පාණ්ඩ්‍ය අධිපතීන් හා තිරුණවෙලියේ හා කොම්බුවේ භටයන් රැස්කරගෙන සටන් සඳහා පිවිසීම. මෙම සිංහල සේනාව පළංකෝට්ටය දක්වා ගොස් කුලශේඛර රජු පරාජය කිරීම.
- චෝළරජු කුලශේඛරට ආධාර වශයෙන් අශ්ව සේනාවක් ඇතුළු විශාල සේනාවක් ලබාදීම නිසා නැවතත් සටන් ඇතිවිය. මෙය සිංහල-චෝළ සටනක් බඳු විය. මේ සටනින් ජය ගත් සිංහල සේනාව චෝළ රටේ ගම් කිහිපයක් ගිනිබත් කොට විනාශ කිරීම. කුලශේඛරගේ හමුදාව විනාශ කිරීම. කුලශේඛර පලා යාම. යුද්ධය අවසන් කර රාජ්‍යය වීර පණ්ඩුට භාර දීම.
- පළවෙනි පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍ය විජය සම්පූර්ණ කිරීම නිමිති කරගෙන පණ්ඩුවිජයගාම නමින් ගමක් පිහිටුවා බමුණන්ට දන්දී මහත් උත්සවයක් පැවැත්වීය.
- මේ සටන පිළිබඳව චෝළ ශිලා ලිපිවල සඳහන් වන්නේ වෙනත් ආකාරයකට ය.
- දෙවැනි රාජාධිරාජ රජුගේ පස්වන රාජ්‍ය වර්ෂයේදී නිකුත් කළ ආර්පාක්කම් ලිපියේ සඳහන් වන්නේ මුල් අවස්ථාවේදී කුලශේකර පරදවා ලංකාපුරය ජයගත් බවයි.
- දෙවැනි රාජධිරාජ රජුගේ අටවැනි රාජ්‍ය වර්ෂයේ නිකුත් කළ පල්ලවරායන් පෙටටෙ සෙල්ලිපිය අනුව කුලශේඛර රජු චෝළ ආධාර ඉල්ලා ඇති අතර එහිදී චෝළ රජු ආධාර දෙමින් අණ කර ඇත්තේ සිංහල සේනාව මරා ඔවුන් මධුරාවේ

Department of Examinations

දොරටුවල තබා ඇන ගසන ලෙස ය. මෙම සෙල්ලිපියට අනුව චෝළ සේනාපතියා කුලශේඛර රජු සිහසුනට පත්කොට, ලංකාපුර දණ්ඩනායක හා අන් සෙන්පතියන්ගේ හිස් මධුරාවේ දොරටුවේ තබා ඇණ ගසා චෝළ රජුගේ අණ අකුරටම පිළිපැද්ද බව කියවේ.

- රාජාධිරාජ රජුගේ දොළොස්වන රාජ්‍ය වර්ෂයේ නිකුත් කළ තිරුවානංගාඩු ශිලා ලිපියට අනුව කුලශේඛර රජු චෝළයන්ට විරුද්ධ වී පරාක්‍රමබාහු රජු හා මිත්‍ර වී ඇති බවත් මේ නිසා චෝළයින් කුලශේඛර රජු පළවාහැර වීරපණ්ඩු සිහසුනේ තැබූ බවත් කියවේ.
- කෙසේවෙතත්, දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණයේදී විශාල වශයෙන් මානව හා භෞතික සම්පත් ප්‍රමාණයක් විනාශ වී ඇත.

*(ලකුණු 06යි)*

5. **හයවන පරාක්‍රමබාහු රජුගේ පාලන සමයේ දේශපාලන හා සංස්කෘතික වැදගත්කම විචාරාත්මකව පරීක්ෂා කරන්න.**

- මූලාශ්‍රය - රාජාවලිය, පැරකුම්බා සිරිත, සෙල්ලිපි (බෙලිගල සන්නස, වහරක්ගොඩ හි පැපිලියානේ සෙල්ලිපි, මඩවල පර්වත ලිපි) හා සන්දේශ කාව්‍ය.

**දේශපාලන**

- කෝට්ටේ රාජධානිය කරගනිමින් පාලනය මෙහෙය වූ අතර ලංකාව අවසන් වරට එක්සෙසත් කළ පාලකයා විය.
- මේ රජු සමකාලීනව දේශපාලන බලය වර්ධනය කරගනිමින් සිටි දැදිගම පරාක්‍රමබාහු අභිබවා ගොස් එම රජ පවුලෙන් විවාහ සබඳතා ද ඇති කර ගෙන, දැදිගම ඇතුළු සතර කෝරළය පමණක් නොව උඩරට ප්‍රදේශවල මෙන් ම ගම්පොළ රාජධානියේත් සිය ආධිපත්‍යය පැතිරවීමට සමත් විය.
- ක්‍රි. ව. 1412 රයිගම දී රජ වී පසුව 1415දී ජයවර්ධනපුර කෝට්ටේ අගනුවර බවට පත් කර ගත්තේය.
- වියළි කලාපයේ හා රුහුණු රටේ පැවති ස්වාධීන පාලන ඒකකවල හා වන්නි ජනපදවල විසූ මහාවන්නියාර්වරු හෙවත් දහඅට වන්නි ප්‍රධානීන් අවනත කර ගැනීම.
- සපුමල් කුමරුගේ නායකත්වයෙන් හමුදා මෙහෙයවා යාපනයේ පාලක ආර්යචක්‍රවර්ති පරාජය කොට එම ප්‍රදේශ අත්පත් කර ගැනීම.
- ජෝතිය සිටාණන් ඇති කළ කැරැල්ල අම්බුලුගල කුමාරයා යවා මර්දනය කරවීම හා සතර කෝරළයේ හා උඩරට ප්‍රදේශයේ බලය පැතිරවීම.
- උඩරට බලය අල්ලාගෙන සිටි වික්‍රමබාහු සාමාන්තයාගේ අවනත කරගැනීමට සමත් විය.
- දකුණු ඉන්දියාවේ තොටුපලක් වූ අදිවිරරාමපටුන ආක්‍රමණය කර ජයගැනීම (ගිරා සන්දේශයේ දක්වා ඇත).
- විජයනගර් අධිරාජයා විසින් එල්ල කළ ආක්‍රමණය ජයගැනීම.

Department of Examinations

➢ චීනය සමග සම්බන්ධතා පැවති බව.

සංස්කෘතිය

➢ හයවන පරාක්‍රමබාහු රජ සමයේ පැවති දේශපාලන, ආර්ථික දියුණුව සංස්කෘතියේ වර්ධනයක් ඇතිවීමට හේතු විය. රාජ්‍ය අනුග්‍රහය අධ්‍යාපනයේ වර්ධනයට පිටුබලයක් විය.

➢ පැපිලියානේ සුනේත්‍රදේවි පිරිවෙන තම මව සිහිවීම පිණිස රජතුමා විසින් කරවන ලදි.

➢ වීදාගම ශ්‍රී ඝනානන්ද, තොටගමුවේ විජයබා, දෙවුන්දර ඉරුගල්කුලතිලක, කෑරගල පද්මාවති, පැපිලියානේ සුනේත්‍රාදේවි සහ එරබත්ගොඩ ධර්මරාජ වන පිරිවෙන් ප්‍රකට ශාස්ත්‍රායතන වීම.

➢ මෙම අධ්‍යාපන ආයතනවල සිටි භික්ෂූන් වහන්සේ සුවිශාල ධර්ම ශාස්ත්‍රීය සේවයක නිරතවූහ (වීදාගම මෛත්‍රීය හිමි, කෑරගල වනරතන හිමි, තොටගමුවේ ශ්‍රී රාහුල හිමි).

➢ මෙම අධ්‍යාපන මධ්‍යස්ථානවල සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත හා දෙමළ වැනි භාෂාවන් ද කාව්‍ය, නාටක, ජ්‍යොතිර්විද්‍යා, ගණිතය, චතුර්වේදය, වෛද්‍ය ශාස්ත්‍රය වැනි විවිධ විෂයයන් ද ඉගැන්වීම.

➢ ගිහි පැවිදි පඬිවරුන් විවිධ ක්ෂේත්‍රවලට අයත් ග්‍රන්ථ රචනයෙහි නිරතවූහ (මහා කාව්‍ය, බුදුගුණ කාව්‍ය, සන්දේශ කාව්‍ය, උපදේශ ග්‍රන්ථ හා ප්‍රශස්ති ආදිය).

➢ වනවාසි හා ග්‍රාමවාසි භික්ෂූන් තරඟයට ග්‍රන්ථකරණයෙහි නියුක්තවීම හේතු කොටගෙන සාහිත්‍ය ප්‍රබෝධයක් හටගැනීම. වනවාසී සම්ප්‍රදාය කෑරගල පද්මාවති පිරිවෙනෙහි ද ග්‍රාමවාසි සම්ප්‍රදාය තොටගමුවේ විජයබා පිරිවෙනෙහිද ප්‍රධානත්වයෙන් වර්ධනය විය.

➢ මෙම අධ්‍යාපන ආයතන ජාත්‍යන්තර කීර්තියට පත්ව තිබීම නිසා විදේශවලින් ගිහි පැවිදි සිසුන් පැමිණ ඇත. නිදර්ශනඃ ශ්‍රී රාමචන්ද්‍ර කවිභාරතී පඬිවරයා ශ්‍රී රාහුල මාහිමියන්ගෙන් අධ්‍යාපනය ලැබීමට තොටගමු විජයබා පිරිවෙනට පැමිණීම.

➢ විවිධ පඬිවරුන් විභාල වශයෙන් සාහිත්‍යකරණයේ නිරත වීමඃ

- වීදාගම මෛත්‍රී හිමි - බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, හංස සන්දේශය
- තොටගමුවේ ශ්‍රී රාහුල හිමි - කාව්‍යශේඛරය, සැළලිහිණි සන්දේශය, පරෙවි සන්දේශය
- වැත්තෑවේ හිමි - ගුත්තිල කාව්‍ය
- ශ්‍රී රාමචන්ද්‍ර කවිභාරතී - භක්තිශතකය, වෘත්ත රත්නාකාර පඤ්චිකා
- ඉරුගල් කුලතිලක හිමි - කෝකිල සන්දේශය
- ධම්මදින්නාචාර්ය විමලකීර්ති හිමි - සද්ධර්මරත්නාකරය
- නන්තුර්තුනෙයියාර් - රුවන්මල පද්‍යයට නැගීම, නාමාවලිය

Department of Examinations

- සරජෝතිමාලෙ ද්‍රවිඩ භාෂාමය පද්‍ය ග්‍රන්ථය
- පැරකුම්බා සිරිත

➢ බුදුදහමට හා සෙසු ආගම්වලට අනුග්‍රහ දැක්වීමේදී සිදුකෙරුණු සංස්කෘතික දායකත්වය:

- තුන්මහල් දළදා මැදුරක් ඉදිකරවීම.
- රත්නපුර මහසමන් දේවාලය ප්‍රතිසංස්කරණය කරවීම (මහ සමන් දේවාල සන්නස)
- හින්දු ආගමික ස්ථානයක් වූ මුන්නේශ්වරම් දේවාලය ප්‍රතිසංස්කරණය.
- බ්‍රාහ්මණයන්ට අනුග්‍රහ දැක්වීම (ඔරුවල තඹ සන්නස, නායිමන දෙමළ පුවරු ලිපිය, ගිරා සන්දේශය)
- කෝට්ටේ පත්තිනි දේවාලයක් ඉදිකරවීම.

➢ මෙකල සමස්ත දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික යන සෑම අංශයකම පාහේ ප්‍රබෝධයක් ඇතිවීම.

*(ලකුණු 14යි)*

6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල ලන්දේසීන් විසින් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය විග්‍රහ කරන්න.

➢ ලන්දේසීන් පෙරදිගට පැමිණියේ වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීම සහ ස්වකීය ආගම වූ ප්‍රොතෙස්තාන්ත ආගම (කැල්වින් දහම) ප්‍රචාරය කිරීමටයි. එසේ වුවත්, ඔවුන්ගේ ආර්ථික අරමුණ වඩාත් ප්‍රබල වී යයි කිව හැක.

➢ ලන්දේසි වෙළඳ සමාගම විසින් ආර්ථික ප්‍රතිපත්ති මෙහෙයවීය.

➢ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු දෙකක් විය.

- යුරෝපය තුළ ඒ වන විට වෙළඳ වටිනාකමක් පැවති ද්‍රව්‍ය මෙරටින් ලබාගැනීම. (කුරුඳු, ගම්මිරිස් ඇතුළු අනෙකුත් කුළුබඩු,)
- ශ්‍රී ලංකාවේ වරායන් ආශ්‍රිතව මෙතෙක් කල් වෙළඳ කටයුතුවල නියැලුණු ආසියානු වෙළඳුන්ගේ (චීන, අරාබි, මලබාර්) වෙළඳ ඒකාධිකාරය තමන් අතට පත්කර ගැනීම.

➢ ලන්දේසීන් මූලික වශයෙන් ස්වකීය ආර්ථික කටයුතු සඳහා දේශීය ආර්ථික හා පරිපාලන ක්‍රමය ඒ ආකාරයෙන්ම ක්‍රියාවට නැංවීය:

- පාරම්පරිකව පැවති ඉඩම් භුක්ති ක්‍රමය ප්‍රයෝජනයට ගැනීම.
- කුල ක්‍රමය සහ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය උපයෝගී කරගැනීම.

➢ එසේ නමුත් ලන්දේසීහු ඔවුන්ටම ආවේණික ලක්ෂණ සහිත ප්‍රතිපත්තියක්ද ක්‍රියාත්මක කළහ.

Department of Examinations

- ලංකාවේ ඉඩම් පිළිබඳ තොරතුරු අඩංගු තෝම්බු සකස් කිරීම මගින් ලන්දේසීන් ආර්ථික වටිනාකමක් සහිත ඉඩම් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම.
- ප්‍රධාන වෙළඳ ද්‍රව්‍යය ලෙස කුරුඳු සැලකුව නමුත් ලන්දේසීන් සිය අයවැය පරතරය පියවාගැනීම සඳහා භාවිත කළේ පුවක් වෙළඳාමෙන් ලද ආදායමයි.
- කුරුඳු, කෝපි වගා කරවීම
- අන්තර්-ආසියාතික වෙළඳාමට සම්බන්ධ වීම.
- ඇළ මාර්ග ඉදිකරවීම (ප්‍රවාහනය).
- ඇතැම් වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කරවීම හා ආණ්ඩුවේ වියදම් අඩුකර ගැනීමේ අරමුණින් සහල් නිෂ්පාදනය පවත්වාගෙන යෑම.

  කිරම, ඌරුබොක්ක වැනි ප්‍රදේශ පදනම් කරගෙන වැව් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගැනීම හා මුතුරාජවෙල අස්වැද්දීම .
- කපු වැවීම, සහ රෙදි සායම්කරණය සඳහා භාවිතා කළ ඉන්ඩිගෝ වැවීම.
- ඇතැම් ප්‍රදේශවල කුරුඳු වගා කිරීමට පියවර ගැනීම. උදා: කදිරාන, ඇවරිවත්ත, කුරුඳුවත්ත
- උඩරට රාජධානිය සමග අභ්‍යන්තර වෙළඳාමක් පවත්වාගෙන යාම හා රට තුළ වෙළඳාමේ ඒකාධිකාරයක් ගොඩනගාගැනීම.

  ලුණු, කරවල වැනි දෑ උඩරටටත්, එම ප්‍රදේශයෙන් ගම්මිරිස්, බුලත්, කරාබු නැටි, කරදමුංගු, මී ඉටි, මී පැණි ඇතුළු ද්‍රව්‍ය සමූහයක් වෙරළබඩ ප්‍රදේශවලටත් තවලම් මගින් ප්‍රවාහනය කිරීම.

*(ලකුණු 14යි)*

Department of Examinations

7. '1818 බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් අරගලය ශ්‍රී ලංකා ඉතිහාසයේ තීරණාත්මක අවස්ථාවක් සලකුණු කරයි.'

**(i) බ්‍රිතාන්‍ය විරෝධී අරගලය ආරම්භ වූ ප්‍රදේශය නම් කරන්න.**

ඌව-වෙල්ලස්ස ප්‍රදේශය

*(ලකුණු 01යි)*

**(ii) බ්‍රිතාන්‍ය විරෝධී අරගලයේ නායකයන් දෙදෙනෙකු නම් කරන්න.**

කැප්පිටිපොල අදිකාරම්, මඩුගල්ලේ, කිවුලේගෙදර මොහොට්ටාල, කණිෂ්ඨ පිළිමතලාවේ, බූටෑවේ රටේ රාළ, කොහුකුඹුරේ රටේ රාළ, විල්බාවේ දොරේසාමි, ඉහගම හිමි, ගොඩේගෙදර මොහොට්ටාල, දඹවින්න දිසාවේ

*(ලකුණු 02යි)*

**(iii) බ්‍රිතාන්‍ය විරෝධී අරගලය ආරම්භ වූ ආකාරය සැකෙවින් දක්වන්න.**

➢ 1815 දී බ්‍රිතාන්‍යයන් විසින් උඩරට අත්පත් කරගැනීමෙන් පසු මුල සිටම ඔවුන් උඩරටදී ගෙනගිය ප්‍රතිපත්තිය කෙරෙහි භික්ෂූන් වහන්සේ, බහුතරයක් රදළ ප්‍රධානීන්

මෙන්ම සාමාන්‍ය ජනතාව තුළද අප්‍රසාදයක් වර්ධනයවෙමින් තිබිණි. මෙම අප්‍රසාදය 1817 අගදී බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි නැගීසිටීමක් දක්වා වර්ධනය විය.

- ➢ මෙම නැගී සිටීමට පදනම් වන නොසන්සුන් බව මුලින්ම ඌව-වෙල්ලස්ස ප්‍රදේශයෙන් මතුවන අතර පසුව ඒ ප්‍රදේශ කේන්ද්‍ර කරගෙන සංවිධානයවීමක් දක්නට ලැබිණි (විල්බාවේගේ ආගමනය හා සෙසු නායකයන් ඉදිරිපත්වීම).
- ➢ ආසන්නතම හේතුව වශයෙන් සැලකෙන්නේ මඩිගේ බද්ද මුහන්දිරම් තනතුර මුස්ලිම් ජාතිකයෙකු වූ හජ්ජි මරික්කාර්ට පිරිනැමීම හා ඔහුගේ අත්තනෝමතික ක්‍රියාකලාපයයි.
- ➢ මෙම අරගලය බ්‍රිතාන්‍යයන්ගේ විශේෂ අවධානයට ලක්වන්නේ නොසන්සුන්තාව මැඩපැවැත්වීමට පිටත් කළ විල්සන්, අරගලකරුවන් විසින් ඝාතනය කළ හෙයිනි.
- ➢ මෙම නැගීසිටීම මර්දනයට යවන ලද කැප්පිටිපොළ දිසාවේ බ්‍රිතාන්‍ය විරෝදී ස්ථාවරයක් ගනිමින් සටන්කරුවන්ට එක්වීම එහි තීරණාත්මක අවස්ථාවකි.
- ➢ මුලදී ඌව-වෙල්ලස්ස ප්‍රදේශයෙන් මතුවුවත් ක්‍රමයෙන් මෙම නැගීසිටීම උඩරට පළාත්වල සැලකිය යුතු ප්‍රදේශයක ව්‍යාප්ත විය.

*(ලකුණු 03යි)*

**(iv)** 1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලයෙන් උද්ගත වූ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින් එය ශ්‍රී ලංකා ඉතිහාසයේ තීරණාත්මක අවස්ථාවක් සලකුණු කරන අයුරු පරීක්ෂා කරන්න.

- ➢ මෙම අරගලය ඉංග්‍රීසීන් විසින් දැඩි ලෙස මර්දනය කිරීම (යුධ නීතිය පැනවීම / බිම්පාළු ප්‍රතිපත්තිය). එසේම එම නැගී සිටීම හේතුවක් කොටගෙන ඉංග්‍රීසීන් විසින් තමන්ට රිසි පරිදි උඩරට පරිපාලන ව්‍යුහයේ වෙනස්කම් ඇති කිරීම (1818 නොවැම්බර් 21 උඩරට ප්‍රකාශනය).
- ➢ එමගින් ඉංග්‍රීසීන් උඩරට ප්‍රදේශවල ස්වකීය බලය තහවුරු කරගැනීම.
- ➢ උඩරට ප්‍රදේශ තවදුරටත් වෙනම පාලන ඒකකයන් ලෙස පවත්වාගෙනගෙන යාම.
- ➢ උඩරට රදළ ප්‍රධානීන්ගේ පරිපාලන බලතල කප්පාදු හා එමගින් ඔවුන්ගේ සමාජ-ආර්ථික වරප්‍රසාද සීමා කිරීම. මේ හේතුකොටගෙන උඩරට සාම්ප්‍රදායික නායකත්වය දුර්වල වීම.
- ➢ පැවති යුක්තිය පසිඳලීමේ හා දඬුවම් නියම කිරීමේ ක්‍රමය වෙනස් කිරීම.

මේ ආදී අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පිළිබඳ විග්‍රහ කළ යුතුයි.

*(ලකුණු 08යි)*

Department of Examinations

8. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

- 1972 ජනරජ ව්‍යවස්ථාව සකස්කරන ලද්දේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරමිනි. එහෙයින් මෙය දේශීය නිර්මාණයකි.
- මෙම ව්‍යවස්ථාව 1972 සිට 1978 දක්වා ක්‍රියාත්මක විය.
- මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමග එතෙක් පැවති සෝල්බරි ව්‍යවස්ථාව අහෝසි විය.
- මෙම ව්‍යවස්ථාව ජනරජ ව්‍යවස්ථාවකි.
- මෙතෙක් බ්‍රිතාන්‍ය කිරීටය සමග පැවති සම්බන්ධතා මේ සමග අවසන් විය.
    - බ්‍රිතාන්‍ය රැජිණ තවදුරටත් මෙරට නායිකාව නොවීය. එහෙයින් අග්‍රාණ්ඩුකාර තනතුර අහෝසි විය.
    - ප්‍රිවි කවුන්සිලයට අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය අහෝසි කෙරිණ.
    - ශ්‍රී ලංකාව ස්වෛරී ජනරජයක් විය. ඒ සමග රටේ නාමය ද ශ්‍රී ලංකාව නම් විය.
- පාලනය හා සම්බන්ධ ව්‍යවස්ථාදායක බලය පැවරුණේ මහජන ඡන්දයෙන් තෝරාගත් මන්ත්‍රීවරුනගෙන් සමන්විත වූ ජාතික රාජ්‍ය සභාවටය.
- ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් වූයෙන් එතෙක් පැවති සෙනෙට් සභාව අහෝසි විය. ජනතාවගේ පරමාධිපත්‍යය උත්තරීතර බව ප්‍රකාශ වින.
- ජාතික රාජ්‍ය සභාවට සීමාවකින් තොරව ව්‍යවස්ථා පැනවීමේ බලයක් පැවරින. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පැවති සීමා (29 (2) ) ඉවත් කෙරිණ. මෙතෙක් පැවති රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම අහෝසි කෙරිණ.
- විධායක කටයුතු මෙහෙයවන ලද්දේ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විසිනි. අහෝසි කළ ඉහත කී කොමිසම් සභා බලතල ක්‍රියාත්මක කරන ලද්දේ විධායකය විසිනි.
- ජනාධිපති ධූරය නාමික විධායකයක් බවට පත් විය.
- මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්ති ව්‍යවස්ථාවට ඇතුළත් කොට තිබිණ. ජාතික භාෂාව, ජාතික ආගම, ජාතික ගීය, ජාතික කොඩිය ව්‍යවස්ථාවට ඇතුළත් කොට තිබිණ. බුද්ධාගම ආරක්ෂා කරන බවට හා පෝෂණය කරන බවට වගන්ති ඇතුළත් විණි.
- මෙම ව්‍යවස්ථාව යටතේ පවත්වන ලද එකම මැතිවරණය 1978 දී පැවැත්විණ. මන්ත්‍රීවරු 168 දෙනෙකු තෝරාගනු ලැබිණ.

*(ලකුණු 14යි)*

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

**(i)** රජරට චෝළ ආධිපත්‍යය

**(ii)** දෙවන පරාක්‍රමබාහු රජතුමා

Department of Examinations

(iii) ගම්පොළ අවධියේ යාපන රාජ්‍යයේ බල ව්‍යාප්තිය

(iv) දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ බෞද්ධ පුනර්ජීවනය

(v) පොන්නම්බලම් රාමනාදන්

(vi) 1956 මහා මැතිවරණය

(i) රජරට චෝළ ආධිපත්‍යය

- ක්‍රි. ව. දහවන සියවසේ එල්ල වූ දකුණු ඉන්දියානු චෝළ ආක්‍රමණ නිසා අනුරාධපුර රාජධානිය බිඳවැටුණි.
- උතුරු ලංකාවේ චෝළ ආධිපත්‍යය පැතිර වූ ප්‍රබල චෝළ පාලකයන් දෙදෙනා වූයේ පළමුවන රාජරාජ හා පළමුවන රාජේන්ද්‍ර යි. චෝළ ආධිපත්‍යය පැවති සමයේ සිටි අනෙක් පාලකයන් වූයේ පළමුවන රාජාධිරාජ, දෙවන රාජේන්ද්‍ර, වීර රාජේන්ද්‍ර, අධිරාජේන්ද්‍ර සහ පළමුවන කුලෝත්තුංගයි.
- දුර්වල පාලකයෙක් වූ පස්වන මිහිඳු රජ දවස රාජරාජගේ ආක්‍රමණික චෝළ හමුදා ලංකාවට ගොඩ බැස, අනුරාධපුරය කොල්ලකා විනාශ කිරීම. පස්වන මිහිඳු රජු රෝහණයට පලායාම.
- ඉන්පසු එළඹි අවුරුදු විස්සකට අධික කාලය රජරට බලය පවත්වා ගැනීමට රාජරාජ සමත් වී යයි මතයක් පැවතීම.
- චෝළ අධිරාජයා වූ රාජේන්ද්‍ර විසින් ක්‍රි. ව. 1017 දී පස්වන මිහිඳු රජු සිරකරුවෙකු ලෙස අල්ලා ගෙන චෝළ දේශයට රැගෙන යාමෙන් පසු රජරට ප්‍රදේශය චෝළ අධිරාජ්‍යයේ කොටසක් බවට පත් විය. චෝළයන් විසින් එය 'මුම්මුඩි සෝළමණ්ඩලම්' ලෙස නම් කිරීම. එසේම, පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගත් අතර එය 'ජනනාථමංගලම්' ලෙස හැඳින්වීම.
- මුම්මුඩි සෝළමණ්ඩලම් කොටස් දෙකකට බෙදා තිබීම - රාජරාජ වළනාඩු හා වික්කිරම ශෝළ වළනාඩු.
- පළමුවන රාජරාජ හා පළමුවන රාජේන්ද්‍ර යන රජුන්ගේ සෙල්ලිපි ලංකාවෙන් හමුව තිබීම (පළමුවන රාජේන්ද්‍රගේ තිරුමණිණි වළර ප්‍රශස්තිය සහ දනට පොළොන්නරුවේ හා කොළඹ කෞතුකාගාරයේ තැන්පත්කොට ඇති සෙල්ලිපි).
- මෙරට සිටි චෝළ ප්‍රාදේශික පාලකයන් (ආණ්ඩුකාරවරුන්) පිළිබඳව තොරතුරු හමු නොවන අතර චෝළයින් විසින් ලංකාව පාලනය කළ ආකාරය ගැන යම් යම් අනුමාන පමණක් තිබීම (යුද්ධ හමුදාවේ උසස් තනතුරු, පාලන තන්ත්‍රයේ උසස් තනතුරු දකුණු ඉන්දියානුවන් දැරූ බව. ප්‍රාදේශීය පාලනයේ ගම ප්‍රධාන වීම. බදු අය කර තිබීම -රාජරාජගේ තන්ජෝර්හි ඇති ලිපියක ලංකාවේ ගම් පහකින් ගත් බදු තන්ජෝර දේවාලයට ප්‍රධානය කිරීම පිළිබඳව සඳහන් වීම හා එකී බදු මුදල්, වී, මී ගසේ කිරිවලින් ගෙවා තිබීම. එසේම, වාර්ෂිකව කප්පම් ගෙවීමක්ද සිදු වන්නට ඇත.
- ඔවුන්ගේ පාලන සමයේදී බෞද්ධාගමික ගොඩනැගිලි විනාශ කිරීම සිදු කර ඇත. කෙසේවෙතත්, ඇතැම් අවස්ථාවලදී ප්‍රදානයන්ද කර තිබීම (වෙල්ගම්වෙහෙරට - රාජරාජපෙරුම්පල්ලි).

Department of Examinations

- හින්දු කෝවිල් ගණනාවක් ඉදිකිරීම (වානවණ්මාදේවී ඊශ්වරම්). තඹ හා ලෝකඩවලින් කළ හින්දු දේව ප්‍රතිමා රැසක් හමු වී ඇත (ශිව, විෂ්ණු, පාර්වතී, නටරාජා). චෝළ අධිරාජ්‍යයේ ප්‍රාදේශීය නිලධාරියෙකු විසින් මන්නාරමේ ගොඩනගන ලද කෝවිලක් අධිරාජයාගේ නම මුල් කරගෙන 'රාජරාජේශ්වර' යනුවෙන් නම් කර ඇත. මෙකල පදවියේ ද හින්දු කෝවිලක් ඉදිකර තිබේ.
- චෝළ බල ප්‍රදේශ පුරාම දකුණු ඉන්දියානු වෙළෙඳ ශ්‍රේණි පැතිර සිටි බව පෙනේ.
- 1070 දී පළමුවන විජයබාහු රජතුමා චෝළ ආධිපත්‍යයෙන් රජරට මුදා ගැනීමට සමත් වීම.

*(ලකුණු 07යි)*

**(ii) දෙවන පරාක්‍රමබාහු රජතුමා**

- දෙවන පරාක්‍රමබාහු රජු (1236-1270) දඹදෙණිය රාජධානිය කරගත් පළමුවන පාලකයා වූ තුන්වන විජයබාහු රජුගේ පුත්‍රයාය.
- මේ රජුගේ රාජ්‍ය සමය දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික වශයෙන් කැපී පෙනෙන අවධියක් විය.

<u>දේශපාලන</u>

- අභ්‍යන්තර හා විදේශ ආක්‍රමණ ජයගනිමින් දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනැගීම.
- වන්නි පාලකයින් අවනත කරගැනීම.
- කාලිංග මාඝ පළවා හැරීම.
- චන්ද්‍රභානුගේ ආක්‍රමණ පරාජය කිරීම.
- පාණ්ඩ්‍ය ආක්‍රමණ මැඩලීම (මේ පිළිබඳ මූලාශ්‍රගත තොරතුරු අපහැදිලිය).

<u>ආර්ථික</u>

- විදේශ වෙළෙඳාම (දෙවුන්දර පුවරු ලිපිය).
- පොල්, කොස්, කපු වගාවන් සිදු කරවීම.

<u>ආගමික හා සංස්කෘතික</u>

- දඹදෙණියේ දළදා මැදුරක් ඉදිකරවීම.
- දළදා වහන්සේ බෙලිගල සිට දඹදෙණියට වැඩමකරවීම හා දළදා පූජා පැවැත්වීම.
- උපසම්පදා කර්මයට අනුග්‍රහ දැක්වීම හා කඨින පූජෝත්සව පැවැත්වීම.
- ශාසන සංශෝධනය හා දඹදෙණි කතිකාවත ප්‍රකාශයට පත් කරවීම.
- අනුරාධපුර හා පොළොන්නරු නගර ප්‍රතිසංස්කරණය කිරීම.
- දිවයිනේ විවිධ ස්ථානවල වෙහෙර විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.
- භික්ෂු අධ්‍යාපනයට අනුග්‍රහ දැක්වීම.

Department of Examinations

- පිරිවෙන් ඉදිකරවීම (නන්දන පිරිවෙන, පළාබත්ගල, බෙලිගල භුවනෙකබාහු පිරිවෙන්).
- දෙවිනුවර උපුල්වන් දේවාලය ප්‍රතිසංස්කරණය කිරීම හා වාර්ෂික ඇසළ පෙරහැර පවත්වන්නට නියම කිරීම.
- ශ්‍රීපාදස්ථානයට යන මාර්ගය පිළිසකර කරවීම.
- රජතුමා උගත් පඬිවරයෙක්වීම හා ග්‍රන්ථකරණයේ යෙදීම (කව්සිළුමිණ, විසුද්ධිමග්ගසන්නය, වනවිනිසසන්නය)
- රජතුමා 'කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත' යන විරුදයෙන් හැඳින්වීම.
- රජු ග්‍රන්ථකරණයට අනුග්‍රහ දැක්වීම: මෙකල සිංහල, පාලි හා සංස්කෘත යන භාෂාවන්ගෙන් විවිධ ක්ෂෙත්‍ර අළලා ගද්‍ය හා පද්‍ය ග්‍රන්ථ රචනාවීම (පූජාවලිය, දෛවඥකාමධෙනු, සද්ධර්මරත්නාවලිය, හත්ථවනගල්ලවිහාරවංසය, භෙසජ්ජමඤ්ජුසා, යෝගාර්ණවය, සමන්තකූටවණ්ණනා).

*(ලකුණු 07යි)*

**(iii)** ගම්පොළ අවධියේ යාපන රාජ්‍යයේ බල ව්‍යාප්තිය

- මේ පිළිබඳ තොරතුරු ලැබෙන මූලාශ්‍රය කිහිපයක් ලෙස කොටගම ද්‍රවිඩ ලිපිය, මැදවල විහාර ලිපිය, නිකාය සංග්‍රහය, රාජාවලිය, අලකේශ්වර යුද්ධය සඳහන් කළ හැකිය.
- ලංකා ඉතිහාසයේ ගම්පොළ රාජධානි යුගය ලෙස සැලකෙන්නේ දළ වශයෙන් ක්‍රි. ව. 1341-1410 අතර කාලයයි.
- යාපනය කෙන්ද්‍ර කරගෙන උතුරේ රාජ්‍යයක් ගොඩනැගීම ආරම්භ වූයේ ක්‍රි. ව. 1310 - 1311 කාලයේදී ය.
- යාපනය රාජ්‍යයේ පාලකයන් 'ආර්යචක්‍රවර්ති' යන පොදු නාමයෙන් හඳුන්වා ඇත.
- ගම්පොළ රාජධානි සමය වන විට ආර්යචක්‍රවර්තිගේ බලය වර්ධනය වෙමින් පැවතිණි.
- ක්‍රි. ව. 1344 මෙරටට පැමිණි ඉබ්න් බතූතා ආර්යචක්‍රවර්ති 'ලංකාවේ සුල්තාන්' ලෙස හඳුන්වා තිබේ. එවකට මුතු වෙළෙඳාම ද ආර්යචක්‍රවර්ති අත පැවති බව දක්වයි.
- ගම්පොළ තුන්වන පාලකයා වූ තුන්වන වික්‍රමබාහු රජ දවස (ක්‍රි . ව. 1356/57-1371/1372) ආර්යචක්‍රවර්තිගේ හමුදාව සිංහල රාජධානියට කඩා වැදුණු බව කොටගම ද්‍රවිඩ ලිපියේ සඳහන් වේ.
- මැදවල විහාර ලිපියට අනුව තවත් අවස්ථාවකදී ආර්යචක්‍රවර්ති විසින් රට අභ්‍යන්තරයේ බලයක් ගොඩනගා ගෙන තිබූ බව පැහැදිලි වේ. එසේම, රට අභ්‍යන්තරයේ ප්‍රදේශ කීපයක් වන සිදුරුවාන, බලවිට, මාතල, දුම්බර හා සගම තුන්රට 'මඩිගය' (බදු) බමුණන්ට පවරාදීමෙන් මෙකී කාරණය තවදුරටත් පැහැදිලි වේ.

Department of Examinations

- ➢ එමෙන්ම මේ වනවිට ආර්යචක්‍රවර්ති කොළඹ, වත්තල, හලාවත, මීගමුව යන වෙරළ මධ්‍යස්ථානයන්හි බලය අත්පත් කරගෙන තිබිණි. ඉන්දියන් සාගරයේ වෙළෙඳාම ද මොහු අත පැවතිණි.
- ➢ ආර්යචක්‍රවර්ති පළවා හැරීම සඳහා එකළ අගමැතිව සිටි අලගක්කෝනාර (අලකේශ්වර) කෝට්ටේ බලකොටුවක් ඉදිකිරීම ඇතුළු තවත් පියවර කිහිපයක් ගෙන ඇත. මෙකී අලගක්කෝනාර, යුද සංවිධානය ශක්තිමත් කිරීමෙන් පසුව ආර්යචක්‍රවර්තිගේ බදු එකතු කරන්නන්හට පහරදී පළවා හැරියේය.
- ➢ මේ බව ඇසූ ආර්යචක්‍රවර්ති කෝපයට පත් ව ගොඩින් හා මුහුදින් එකවර පහරදීම සඳහා සේනාංක දෙකක් එවීය. ගොඩින් පැමිණි සේනාව මාතලේ කඳවුරු බැඳගත් අතර මුහුදින් පැමිණි සේනාව දෙමටගොඩ හා ගොරකාන කඳවුරු බැඳ ගැනීම.
- ➢ මේ තත්ත්වය නිසා ගම්පොළ පාලකයා වූ පස්වන භුවනෙකබාහු රජු රයිගමට පලා ගියේය.
- ➢ උඩරට සේනාව විසින් මාතලේ කඳවුරු බැඳගෙන සිටි සේනාව පරාජය කළේය. අලගක්කෝනාර විසින් දෙමටගොඩ හා ගොරකාන කඳවුරු බැඳගෙන සිටි සේනාව විනාශ කිරීමට සමත් විය.
- ➢ මෙයින් යාපන රාජ්‍යයේ බල ව්‍යාප්තිය සීමා විය.

*(ලකුණු 07යි)*

**(iv)** දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ බෞද්ධ පුනර්ජීවනය

- ▪ ආරම්භය - ක්‍රිස්තියානි මිෂනාරිවරුන්ගේ ආගම් ප්‍රචාරක කටයුතු හා බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලින් බෞද්ධ ආගමට එල්ල වූ අභියෝග හේතු කොට ගෙන ඊට ප්‍රතික්‍රියාවක් ලෙස ආරම්භ විය.
- ➢ ගොගර්ලි වැනි පූජකයන් බෞද්ධාගම විවේචනය කිරීම හා බෞද්ධ නායකයන් ඊට ප්‍රතිචාර දැක්වීමට ඉදිරිපත් වීම:

  මෙම ප්‍රතිචාරයේ කූඨප්‍රාප්තිය සලකුණු කරන ක්‍රියාකාරකම් අතර මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි සහභාගී වූ පානදුරාවාදය වැදගත්.

- ➢ එම වාදයට අමෙරිකාව තුළ ලැබුණු ප්‍රසිද්ධිය හේතු කොට ගෙන පරමවිඥානාර්ථවාදීන්ගේ අවධානය ලංකාව කෙරෙහි යොමුවීම:

  ඕල්කට් තුමා සහ බ්ලැවැත්ස්කි මැතිණිය මෙරටට පැමිණීම: මෙරට පරමවිඥානාර්ථ සංගමය පිහිටුවීම හා බෞද්ධ අධ්‍යාපනයේ අභිවෘද්ධිය සඳහා එම සංගමය ඉදිරිපත් වීම (ආනන්ද, මියුසියස් ආදී බෞද්ධ පාසල් පිහිටුවීම)

- ➢ පිරිවෙන් අධ්‍යාපනයේ පුනර්ජීවනයක් ඇතිවීම:

  1873 මාළිගාකන්ද විද්‍යෝදය පිරිවෙන සහ 1875 පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීම; මේවා ප්‍රාචීන අධ්‍යයනය පිළිබඳ උගතුන් බිහිකරන මධ්‍යස්ථාන බවට පත්වීම.

- ➢ බෞද්ධයන් වෙනුවෙන් යම් යම් අයිතිවාසිකම් දිනාගැනීම:

  බෞද්ධ කොඩිය, වෙසක් නිවාඩු දිනය.

Department of Examinations

- ➢ බෞද්ධ ලිපි හා පොත්පත් පළකරන මුද්‍රණාල බිහිවීම හා එමගින් බෞද්ධාගම ප්‍රචාරය කිරීම හා බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ඇතැම් ප්‍රතිපත්ති විවේචනය කිරීම.
- ➢ නව වෙහෙර විහාර ඉදිවීම හා ථූපාරාමය, රුවන්වැලිසෑය වැනි ඓතිහාසික බෞද්ධ ස්මාරක ප්‍රතිසංස්කරණය කිරීම.

*(ලකුණු 07යි)*

**(v) පොන්නම්බලම් රාමනාදන්**

- ➢ 1851 දී යාපනයේ මානිපායිහි උපත ලැබීය (පියා - වාසලමුදලි අරුණාචලම් පොන්නම්බලම්).
- ➢ හින්දු පුනර්ජීවන ව්‍යාපාරයට දායකත්වය සැපයීම (පාසල් පිහිටුවීම - උඩුවිල් කාන්තා විද්‍යාලය පිහිටුවීම /යාපනේ පරමේශ්වර විද්‍යාලය (වර්තමාන යාපන විශ්වවිද්‍යාලය) පිහිටුවීම).
- ➢ 1873-86 අද්වකාත්වරයෙකු වශයෙන් සේවය කිරීම.
- ➢ 1879-92 ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් දෙමළ මන්ත්‍රීවරයා වීම.
- ➢ 1892-1906 ප්‍රථම ලාංකික සොලිසිටර් ජෙනරාල්වරයා ලෙස කටයුතු කිරීම හා නීතිපති ධුරයේ වැඩබැලීම.
- ➢ 1911-21 ව්‍යවස්ථාදායක සභාවේ 'උගත් ලාංකික' මන්ත්‍රීවරයා වශයෙන් කටයුතු කිරීම.
- ➢ 1821-24 ව්‍යවස්ථාදායකයට නාමකරණයෙන් පත්වීම.
- ➢ 1924-30 ව්‍යවස්ථාදායක සභාවේ උතුරු පළාතේ නිල නොලත් මන්ත්‍රීවරයා වශයෙන් කටයුතු කිරීම.
- ➢ මොහු, ජාතික ව්‍යාපාරයේ කැපී පෙනෙන නායකයෙකු වශයෙන් 1912 සුරාබදු පනතට විරුද්ධව හඬනැගීම හා 1815 සිංහල-මුස්ලිම් කෝලාහලය අවස්ථාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව සිංහලයන් සම්බන්ධයෙන් ක්‍රියාකළ ආකාරය දැඩිව විවේචනය කිරීම.
- ➢ විහාර දේවාලගම් පනත සම්මත කිරීම සඳහා කටයුතු කිරීම.
- ➢ ජාතික ව්‍යාපාරයේ ප්‍රමුඛ නායකයෙකු වුවත් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමට විරුද්ධ වීම.

*(ලකුණු 07යි)*

**(vi) 1956 මහා මැතිවරණය**

- 1956 අප්‍රේල් 5, 7 සහ 10 යන දිනවල මහා මැතිවරණය පැවැත්වීම.
- මෙම මැතිවරණ ව්‍යාපාරයේ කැපී පෙනෙන සිදුවීම් ගණනාවකි:
  - සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව වශයෙන් පිළිගැනීම.

Department of Examinations

- විරුද්ධ බලවේග විසින් 1947 සිට අඛණ්ඩව බලයේ සිටි එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති විවේචනය කිරීම හා ඒවායේ වෙනසක් අවශ්‍ය බව අවධාරණය කිරීම.
- බුද්ධ ශාසන කොමිසම විසින් බුද්ධාගම සම්බන්ධයෙන් ආණ්ඩුවෙන් ඉටුවිය යුතු වගකීම් අවධාරණය කරනු ලැබීම.
- සමාජයේ විවිධ අංශ මුහුණ දී සිටි අර්බුද හමුවේ සඟ-වෙද-ගුරු-ගොවි-කම්කරු යන අංශ නියෝජනය වන 'පංචමහා බලවේගය' සංවිධානය වීම.
- මේ සියලු බලවේග, එවකට පැවති යටත්විජිත ශේෂයන් සහිත ආණ්ඩුක්‍රමය වෙනුවට දේශීයත්වය ගරුකරන නව ආණ්ඩුක්‍රමයක් ලබාගැනීමේ අරමුණ ඇතිව ක්‍රියාකාරී වීම.
- මේ ව්‍යාපාරය එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායකගේ නායකත්වයෙන් යුතු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වටා ඒකරාශී වීම.
- වාමාංශික පක්ෂ වැනි විවිධ කණ්ඩායම් එම පක්ෂය සමග සම්බන්ධ වී මහජන එක්සත් පෙරමුණ නම් සන්ධානය පිහිටුවාගෙන ඒ යටතේ මැතිවරණයට ඉදිරිපත් වීම.

➢ රැස්වීම් හා ගෙන්ගෙට යාම් මගින් ඡන්ද ව්‍යාපාරය සිදුකිරීම.

➢ මහජන එක්සත් පෙරමුණ කැපී පෙනෙන ජයග්‍රහණයක් ලැබීම.

➢ එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය ආසන 8කට පමණක් සීමා වීම.

➢ මෙම මැතිවරණ ව්‍යාපාරය මෙන්ම මහජන එක්සත් පෙරමුණේ ජයග්‍රහණයද මෙරට දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කිරීම.

- දේශපාලන බලය එක් පක්ෂයකින් තවත් පක්ෂයකට මාරුවීම.
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නියෝජනය වූ කොටස් හා එහි කටයුතු වෙනස් වීම:
    - ✓ සිංහල ජාතිකවාදීන්, බෞද්ධයන් හා මාක්ස්වාදීන් වශයෙන් ඒ තුළ මෙතෙක් වෙන්ව සිටි කණ්ඩායම් එක පෙරමුණක් වීම.
    - ✓ ජාතික ඇඳුම / සිංහලෙන් සභාව ඇමතීම.
- නව රජය හා කැබිනට් මණ්ඩලය වෙනස් වීම.
- මැතිවරණ ව්‍යාපාරයේදී පැවති ආණ්ඩුවට එරෙහිව ඉදිරිපත් වූ කරුණු හා විපක්ෂ කණ්ඩායම් ගෙන ආ යෝජනා ජයග්‍රහණය කිරීම මෙරට දේශපාලනය තීරණාත්මක ලෙස වෙනස් කිරීමට සමත් වීම.
    - ✓ ආණ්ඩුව වෙනස් කිරීම අවශ්‍ය බව - අනිසි ලෙස බලය පාවිච්චි කිරීම ධනවාදයට නැඹුරු ප්‍රතිපත්ති ආදිය විවේචනය කිරීම.
    - ✓ සිංහල පමණක් රාජ්‍ය භාෂාව විය යුතු බව - ඉංග්‍රීසි පාසල් හා එම අධ්‍යාපනයට වැඩි තැන ලැබෙන බවට චෝදනා

Department of Examinations

හා ඉංග්‍රීසි උගතුන්ට රජයේ තනතුරු ඒකාධිකාරයක් ඇති බවට චෝදනා ඉදිරිපත් වීම.

- ✓ බුදු සසුනේ චිරස්ථිතියට කටයුතු කළ යුතු බව - බෞද්ධ කොමිසම, එක්සත් බෞද්ධ පෙරමුණ හා සර් ජෝන්ගේ බෞද්ධ විරෝධී ප්‍රකාශවලට එරෙහිව වවේචන කිරීම.
- ✓ ආර්ථික ගැටලු පිළිබඳ අවධාරණය කිරීම - සහල් මිල, පාසල් දරුවන්ට දිවා ආහාරය සැපයීම අත්හිටුවීම, සහතික මිල ක්‍රමය නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම හා ධනවාදී ආර්ථික රටාව පිළිබඳ විවේචන එල්ල වීම.
- ✓ බ්‍රිතාන්‍ය කිරීටය සමග පැවති ආණ්ඩුක්‍රම හා ගිවිසුම්ගත බැඳීම් ඉවත් කළ යුතු බව - හමුදා කඳවුරු.

*(ලකුණු 07යි)*

******

Department of Examinations